Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ගෘහ ආර්ථික විද්‍යාව

සතිය- 10

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# නිපුණතාවය 13 අදාල පසුගිය විභාග ප්‍රශ්න

## 2014

I. ගර්භණීභාවය තීරණය කරන ලක්ෂණ 03ක් සඳහන් කරන්න.
II. ගර්භණී අවධිය තුල මවකට විවිධ ආබාධ ඇති වේ.එබදු ආබාධ 3ක් ඇති වීමට හේතු හා පිළියම් පැහැදිලි කරන්න.
III. ගර්භණී මවක් ඇය හා භ්‍රෑණයාගේ සුරක්ෂිතතාවය සඳහා අනුගමනය කල යුතු පිළිවෙත් සාකච්ඡා කරන්න.
IV. පහත සඳහන් දෑ පහදන්න.
(a) කළලාවාරික තරලය (b) භ්‍රෑණ අවධිය
V. ළදරුවාගේ සංවර්ධනය සඳහා ක්‍රීඩා භාණ්ඩ සැපයීම වැදගත්ය. උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

## 2015

I. මාතෘ සායනයකදී ගර්භණී මවක් රුධිර පරීක්ෂණයට භාජනය කරනු ලබයි. මෙම පරීක්ෂණයෙන් අනාවරණය කරගනු ලබන කරුණු 03 ක් සඳහන් කරන්න.
II. සටහන් ලියන්න.
පූර්ව ප්‍රසව සංවර්ධණය හා සම්බන්ධ
(a) සංසේචනය (b) අධිරෝපණය

## 2016

I. ගර්භණීභාවයෙහි ලක්ෂණ 03ක් සඳහන් කරන්න.
II. වයස මාස 6 – 12 ළදරුවන් පෙන්වන චාලක හැකියා තුනක් ලියන්න.
III. පහත සඳහන් දෑ පිළිබඳව සටහන් ලියන්න.
(a) ඩිම්බමෝචනය (b) එන්ඩොමෙට්‍රියම (අන්තඃඡදය)

## 2017

I. ගර්භණී මවක් විසින් අනුගමනය කල යුතු සෞඛ්‍ය පිළිවෙත් 04 ක් ලියන්න.
II. ගර්භණී මවකගේ මනා පෝෂණ තත්වය සඳහා පූර්ව ප්‍රසව සායනයෙන් සැපයෙන ද්‍රව්‍ය 02ක් නම් කරන්න.
III. ස්ත්‍රී ලිංගික හෝර්මෝන නම් කර ඒවායේ කෘත්‍යය සඳහන් කරන්න.

IV. පූර්ව ප්‍රසව සංවර්ධන අවධි 03 පැහැදිලි කරන්න.

V. උදෑසන ඔක්කාරය හා වමනය ගර්භණී අවධියේදී දක්නට ලැබෙන ලක්ෂණයකි.මෙයට හේතු දක්වා මෙම තත්වය අවම කර ගැනීමට ගත හැකි පියවර සඳහන් කරන්න.

VI. ආරය හා පරිසරය දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක 02කි.
(b) ආරය (b) පරිසරය හඳුන්වන්න

**2018**

I. නවජ දරුවෙක් ප්‍රතීක ක්‍රියා පිළිබිඹු කරයි.
   (a) "ප්‍රතීක ක්‍රියා" යන්න හඳුන්වන්න.
   (b) "ප්‍රතීක ක්‍රියා" සඳහා උදාහරණ 02ක් ලියන්න.

II. පළමු වසර තුල ළදරුවා සමාජයට යොමු කිරීම සඳහා දෙමාපියන් ක්‍රියා කලයුතු ආකාරය පැහැදිලි කරන්න.

III. දරුවකුගේ සංවර්ධනය සිදු වන ආකාර 02කි
   (a) හිසේ සිට දෙපතුල දක්වා
   (b) සිරුර මධ්‍යයේ සිට පර්යන්තය දක්වා

   මෙම ආකාර 2 සඳහා උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරන්න.

**2019**

I. ළදරුවාගේ පළමු වසර තුල, කායික වර්ධනයෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 03ක් ලියන්න.

II. ළදරුවෙකුට අතිරේක ආහාර දීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03ක් විස්තර කරන්න.

III. ළදරුවෙකු සඳහා ලබාදිය හැකි ක්‍රීඩා භාණ්ඩ 04ක් නම්කර, ඒවා ළදරුවාගේ විවිධ හැකියා වර්ධනය කෙරෙහි දායක වන අයුරු පැහැදිලි කරන්න.

IV. භ්‍රෑණයේ සංවර්ධනය සඳහා ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය සැකසී ඇති අන්දම නම් කරන ලද රූපසටහනක් මඟින් දක්වන්න.

V. පහත සඳහන් දෑ පිළිබඳ සටහන් ලියන්න.
   (a) නවජ දරුවා
   (b) නිවසේදී ළදරුවෙකු මුහුණ දිය හැකි අනතුරු

VI. "මාතෘ සායනවල කාර්යභාරය" යන මැයින් පන්තියට කරුණු ඉදිරිපත් කිරීමට ඔබේ කණ්ඩායමට පැවරී ඇත. මෙහි ඇතුලත් කරන කරුණු 04ක් පැහැදිලි කරන්න.